# එක්සත් ජනපදය කියුබාවට එරෙහි සම්බාධක යාන්තමින් ලිහිල් කරත්ම කැස්ත්‍රෝවාදී විරේක කිරීමක් ඇරඹෙයි

## Castroite purge in Cuba as US slightly eases sanctions

**බිල් වෑන් ඕකන් විසිනි**
**2009 මාර්තු 13**

ඉහල පෙලේ ආන්ඩුවේ නිලධාරීන් තොග පිටින් නෙරපා හරින බවට කියුබාව මාර්තු මුල් සතියේ කල නිවේදනය විදහා දක්වන්නේ වැඩ කරන ජනතා ආසක්තයන්ට එරෙහිව කුමන්ත්‍රනයක නියැලි, අර්බුදයට පත් ධනේශ්වර ජාතිකවාදී තන්ත්‍රයක ගතිලක්ෂන ය.

කියුබානු ආන්ඩුව සිය 50 වසරක ඉතිහාසය තුල වඩාත් පුලුල් පරිමානයක නෙරපා හැරීම් නිවේදනය කර ඇත්තේ එයට පාදක වූ දේශපාලන ප්‍රශ්න පිලිබඳව කියුබානු ජනතාව හමුවේ මොනම පැහැදිලි කිරීමකින් හෝ තොරව ය.

සිය තනතුරුවලින් නෙරපා හරින ලද ඇමතිවරුන්ගේ සංඛ්‍යාව 10 කි. එය ආන්ඩුවේ මුලු සංඛ්‍යාවෙන් තුනෙන් එකකට සමාන ය. මෙයට ප්‍රධාන ආර්ථික තනතුරු දරන සියල්ලන්ම පාහේ ඇතුලත් ය. නෙරපාහරින ලද අය වෙනුවට පත්කරන ලද්දේ බොහෝ කොට ම ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් ය. මෙලෙස වර්ධනය වන ආන්ඩුවේ මිලිටරි කරනය සාමාන්‍ය කියුබානු ජනතාව දකින්නේ තරමක චකිතයකින් යුක්තවය. කම්පනයක් ඇති කරන ලද නෙරපාහැරීම් අතුරින් වඩාත්ම කැපී පෙනෙන්නේ කාලෝස් ලාගේ ඉවත් කිරීම ය. ඔහු බලගතු කියුබානු අමාත්‍ය මන්ඩලයෙහි ලේකම් ද රාජ්‍යය මන්ඩලයේ උප සභාපති ද වූ අතර පසුගිය දශකය තුල කියුබානු විදේශීය ප්‍රතිපත්තිය මෙහෙය වූ, විදේශ ඇමති, ෆෙලිප් පෙරෙස් රොක් ද නෙරපා හල කැපීපෙනෙන අයෙකි.

මේ පුද්ගලයින් දෙදෙනාම පුහුනු කර ඇත්තේ, ෆිදෙල් කස්ත්‍රෝ විසිනි. දැනට වසර දෙකකට පෙර රෝගී වූ අනදෙන නිලධාරිවරයා සිය සොහොයුරු රාවුල් කස්ත්‍රෝට බලය පැවරීමට ප්‍රථමයෙන් මේ දෙදෙනා ප්‍රචලිතව සිටියේ 1959 වසරේ දී කස්ත්‍රෝ බලයට ගෙන ආ ගරිල්ලා හමුදාවට සම්බන්ධව නොසිටි "නව පරම්පරාවෙහි" අනුප්‍රාප්තිකයින් වීමේ හැකියාව ඇත්තන් ලෙස ය.

57 වියෙහි පසුවන ලාගේ වෛද්‍යවරයෙකි. ඔහු කියුබානු ආර්ථිකය පිලිබඳ වගකීම භාරගත්තේ සෝවියට් සංගමය විසුරුවා හැරීමට හා දිවයිනේ ආර්ථිකය පෝෂනය කල බිලියන් ගනනක සෝවියට් ආධාර කපා හැරීමෙන් අනතුරුව දුර්භාග්‍යය ගෙන ආ අවධියෙහි ය. පසුගිය වසරෙහි කියුබානු පාර්ලිමේන්තුව නව රාජ්‍ය මන්ඩලයක් තෝරා පත් කර ගත් විට, සිය සොහොයුරාගෙන් නිල වශයෙන් බලය පවරා ගත් රාවුල් කස්ත්‍රෝට පසුව වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත්තේ ලාගේ ය.

සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මන්ඩලයෙහි සිවිල් සාමාජිකයන් තුන් දෙනාගෙන් එක් අයෙකු වූයේ ලාගේ ය. ඔහු වෙනුවට පත් කරන ලද්දේ පසුගිය සතිය තෙක් සන්නද්ධ හමුදා අමාත්‍යාංශයේ ප්‍රධානියාව සිටි මේජර් ජෙනරාල් ජොසේ අමාඩෝ ගුවේරා ය.

43 හැවිරිදි පෙරේස් රොක් ද රාජ්‍යය මන්ඩලයේ හා පාලක මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු විය. තරුනයෙකු වශයෙන් රජය විසින් හසුරුවන ලද ශිෂ්‍ය සංවිධානයන්ගේ නායකයෙකු වූ ඔහු ෆිදෙල් කස්ත්‍රෝ විසින් සිය ප්‍රධාන මාන්ඩලික ප්‍රධාන නිලධාරි වශයෙන් පත් කර ගන්නා ලදී ඔහු එම තනතුරෙහි දශකයක් කල් ගෙවීය. 1999 වසරේ දී ඔහු විදේශ අමාත්‍ය තනතුරට පත්වූ විට කියුබානු නිල පුවත්පත වන ග්‍රැන්මා හි සඳහන් කරන ලද පරිදි ඔහුට පැවති අත්‍යවශ්‍ය සුදුසුකම වූයේ "ෆිදෙල්ගේ අදහස් හා චින්තනය සම්බන්ධයෙන් අන් සියල්ලට පාහේ වඩා හොඳ අවබෝධයක් ඇත්තකු වීමය.

රාජ්‍යය මන්ඩලය විසින් මාර්තු 2 දා නිකුත් කරන ලද කෙටි ප්‍රකාශයකින් ඇමතිවරු අට දෙනෙකු ආදේශ කිරීම හා අමාත්‍යාංශ ගනනාවක් ඒකාබද්ධ කිරීම නිවේදනය කෙරුනි. රටෙහි ආර්ථික ප්‍රතිපත්තිය පිලිබඳ වගකීම දරන ප්‍රධාන නිලධාරියා වූ ලාගේ හා රටේ විදේශ ප්‍රතිපත්තිය මෙහෙයවූ පෙරෙස් රොක් සිය තනතුරුවලින් "නිදහස්" කරන ලද බව එම ප්‍රකාශය විස්තර නොමැතිව සඳහන් කලේ ය.

ජනාධිපති ධුරය නිල වශයෙන් භාරගැනීමෙන් වසරක් ගතවෙත් ම, තමා දශක පහකට ආසන්න කාලයක් නායකත්වය දැරූ සන්නද්ධ හමුදාවන් අතරින් ප්‍රධාන කොට ම තෝරාගන්නා ලද තම පාක්ෂිකයන් රාවුල් කස්ත්‍රෝ විසින් නිලතලවලට පත් කරමින් සිටින බවත් තම සොහොයුරු, ෆිදෙල්ට පක්ෂපාතී අය ඉවත් කරමින් සිටින බවත් සමපේක්ෂනයක් මෙම වෙනස් කිරීම් මගින් නිර්මානය කරනු ලැබුනි. පැහැදිලිව ම එවැනි අනුමානයන් දුරීභූත කිරීමට වෑයම් කරමින් සිය දිග් ගැසුනු සුවපත්වීමේ කාලය තුල ෆිදෙල් ලිවීමට කැප කරන ලද "ආවර්ජන" ලෙස හැඳින්වෙන නිතිපතා පලවන රචනාවලින් එකක් මාර්තු 4 වැනි දා කියුබානු පුවත්පත් සිය මුල් පිටුවල පල කලේ ය. ආන්ඩුව සිදුකල මෙම වෙනස්කම් රචනාවෙන් විස්තර කෙරුනේ නිරෝගී වෙනසක් ලෙස ය.

ඇදහිය නොහැකි වුව ද, ෆිදෙල් ප්‍රකාශ කර සිටියේ තමා ජනාධිපති වශයෙන් කටයුතු කල කාලය තුල ලාගේ හා පෙරෙස් රොක් වැනි පුද්ගලයන් එම තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් තමා කිසිදු වගකීමක් නොදැරූ බව ය. එනමුදු, ඔවුන් ආදේශ කිරීමේ දී ඒ පිලිබඳව තමන් සමග සාකච්ඡා කරන ලද බවට ඔහු ජනතාවට සහතික විය. "බලය පිලිබඳ වරප්‍රසාද ඒ වන විටත් අත්හැර දමා තිබූ තත්වය තුල එම ආදේශයකයින් යෝජනා කල අය මා සමග ඒ ගැන සාකච්ඡා කිරීමට බැඳී සිටින සම්මතයක් නොතිබුනු බව" ඔහු ලිවීය.

එසේ වුව ද, මෙම ජ්‍යෙෂ්ට නිලධාරින් දෙදෙනා ඉවත් කිරීම පිලිබඳව පලමු - හා මෙතෙක් එකම - දේශපාලන සාධාරනීකරනය සැපයීමට හිටපු කියුබානු ජනාධිපති ක්‍රියා කලේ ය.

ඔහු මෙසේ ලිවීයඃ "ඔවුහු බලය අල්ලා ගැනීමේ දී කිසිදු පරිත්‍යාගයක් නොකලහ. එනමුදු, බලය පිලිබඳ මිහිරි අමෘතය ඔවුන් තුල අභිලාෂයන් දල්වාලීය. එය ඔවුනට නින්දා සහගත භූමිකාවක් රඟපෑමට තත්වය සකස් කලේ ය. බාහිර සතුරා ඔවුන් මත සිය බලාපොරොත්තු රඳවා තිබුනි."

මේ රචනාව ලිවීමෙන් දිනකට පසුව සිය "වැරදි" පිලිගනිමින් මුලුමනින්ම පාහේ එයට සමාන ලාගේ හා පෙරෙස් රොක් ගේ ලිපි දෙකක් ග්‍රැන්මා පුවත්පතෙහි පල විය. මේ ලිපි දෙකෙන් සිය කටයුතුවල "වගකීම" මොවුන් දෙදෙනා විසින් භාරගත් අතර ඔවුනට එරෙහිව එල්ල කරන ලද විවේචන "සාධාරන හා ප්‍රගාඪ" ඒවා බවට ද පිලිගත්හ. ඔවුන් සිය ලිපි අවසන් කලේ තම රචනාවෙන් ඔවුන් දූෂිත හා ඇතැම්විට ද්‍රෝහී පුද්ගලයින් ලෙස හංවඩු ගසන ලද ෆිදෙල්ට සිය අඛන්ඩ පක්ෂපාතකම පිලිබඳව දිවුරා සහතිකවෙමිනි.

ඔවුන්ගේ "වැරදි" පිලිබඳ අන්තර්ගතය ගැන හෝ, ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිලිබඳව විවේචන ගැන හෝ, ඔවුන්ගේ "නින්දා සහගත භූමිකාව" ගැන හෝ බාහිර සතුරන්ට ඔවුන් අපේක්ෂාවන් ඇති කල ආකාරය ගැන හෝ ෆිදෙල්ගේ "ආවර්ජනා" තුලින් හෝ චූදිතයන්ගේ පාපෝච්චාරනයන්ට සම්බන්ධ ලිපි තුලින් හෝ කිසිදු ඉඟියක් සැපයී නැත. ඉන් පසු සතියේ මේ පිලිබඳව කියුබාව තුල වචනයක් වත් පලකර ද නැත.

මේ සිදුවීමේ පිලිකුල් සහගත ගති ලක්ෂන අපට හොඳින් හුරුපුරුදු ඒවා ය. ස්ටැලින්වාදයේ ද්වේෂ සහගත ක්‍රම අනුකරනය කරන මේ චාරිත්‍රානුකූල "විවේචනය හා ස්වයං විවේචනය" සැලසුම් කොට ඇත්තේ මේ හබයෙහි දේශපාලනමය අන්තර්ගතය මහ ජනතාවගෙන් වසං කරන ගමන් ම ඔවුන් බිය ගැන්වීමට ය.

කස්ත්‍රෝ තන්ත්‍රයෙහි ඉතිහාසය මේ හා සමාන සිද්ධීන්ගෙන් හැඩි වී ඇත. මේ අතර අතිශයින් කුප්‍රකට සිද්ධියකි, 1989 දී ජනරාල් අර්නල්ඩෝ ඔචෝවා මත්ද්‍රව්‍ය චෝදනා මත වරදකරු කිරීම සඳහා දියත්කල කුමන්ත්‍රනය. ඔහු වනාහි ඊට කලින් 1980 ගනන්වල ඇංගෝලාව තුල දකුනු අප්‍රිකානු හා සීඅයිඒ සංවිධානයේ පිටුබලය ලත් හමුදාවක් පරාජය කිරීමෙහි දී "විප්ලවයෙහි වීරයෙකු" වශයෙන් හුවා දැක්වූ පුද්ගලයෙකි. ඔහු හා තවත් නිලධාරින් තිදෙනෙකු හදිසියේ පැවැත්වූ හමුදා අධිකරනයක දී වැරදිකරුවන් කර වෙඩික්කරුවන්ගේ හට කන්ඩායම් විසින් මරා දමන ලදී.

කස්ත්‍රෝවාදය සමාජවාදය කරා නව විප්ලවකාරී මාවතක් ලෙස දශක ගනනාවක් පුරා හුවා දැක්වීමට ප්‍රයත්න දරා ඇති අය - හා සුලුධනේශ්වර ගරිල්ලාවාදය, විප්ලවකාරී කම්කරු පන්තියක සවිඥානක හා ස්වාධීන දේශපානමය මෙහෙයුමකට යෝග්‍ය ආදේශකයක් ලෙස නිරූපනය කල අය - සමාජවාදයේ නාමය මේ ක්‍රමවේදයන් හා ප්‍රතිබද්ධ ලෙස සැලකීමෙන් කර ඇත්තේ සමාජවාදයේ නාමය කෙලෙසීම පමනි.

ආන්ඩුව තුල සිදුකරන ලද මෙම බලතල වෙනස් කිරීම හා එහි ඉතාමත් කැපීපෙනෙන නිලධාරින් දෙදෙනා සේවයෙන් නෙරපීම හා ඔවුනට අපහාස කිරීම පිලිබඳව කස්ත්‍රෝ තන්ත්‍රය කිසිදු දේශපාලනමය පැහැදිලි කිරීමක් සපයා නැති අතර එහි අභිප්‍රේරනය සොයා යා යුත්තේ වෛෂයික තත්වය හා කියුබාව මුහුන දෙන අතිශය භයානක අර්බුදය තුල ය.

"විශේෂ කාල පරිච්ඡේදය ආරම්භ වීමෙන් පසුව, 2008 වසර ඉතාමත් දුෂ්කර එකක් වීය" යි එම වසර අවසානයේ දී කියුබාවේ ආර්ථිකය භාර ඇමති ජොසේ ලුයි රොඩ්රිගුවෙස් විස්තර කලේ ය. එතුලින් ඔහු ඇඟිල්ල දිගු කලේ 1991 වසරේ දී සෝවියට් සංගමය කඩා වැටීමෙන් පසු කියුබාව මුහුන දුන් ආර්ථික අගාධයට ය. පසුගිය සතියෙහි තනතුරුවලින්

ඉවත්කරන ලද ඉහල පෙලේ නිලධාරීන් 10 දෙනාගෙන් රොඩ්රිගුවෙස් එක් අයෙක් විය. ඔහු වෙනුවට පත් කරන ලද්දේ හිටපු හමුදා කර්නල්වරයෙකු ය.

2009 වසර සඳහා ආර්ථික වර්ධනය පිලිබඳ ඇස්තමේන්තු අඩකින් කපා හැරීමට ආන්ඩුවට බලකෙරී ඇත. දිවයිනේ අවශ්‍යතාවන් සපුරා ලීමේ දී සියයට 80ක් ම ආනයන මත යැපෙන කියුබාවෙහි ආනයන පිරිවැය සියයට 50කින් ඉහල නැග ඇත. ගෝලීය ආර්ථික අර්බුදයෙහි බලපෑම යටතේ එහි ප්‍රධානතම නිර්යාතය වන නිකල්වල මිල සියයට 44කින් පහත වැටී ඇත.

ඛනිජ තෙල් මිල ඒ හා සමානව පහත බැසීම, වෙනිසියුලාවේ හියුගෝ චාවේස්ගේ ආන්ඩුව විසින් පිරිනමන ලද ආධාර එලෙස ම පවත්වා ගෙන යෑම ප්‍රශ්නයට බඳුන් කර තිබේ. 2007 වසරේ දී කියුබානු රජයේ ආදායම් වලින් අඩකට ම වගකියනු ලැබුවේ වෙනිසියුලානු ආධාරය.

මේ අර්බුදය ඉදිරියේ රාවුල් කස්ත්‍රෝගේ ආන්ඩුව විසින් කියුබානු කම්කරු පන්තියේ ඵලදායිතාව වැඩි කිරීමට බල කෙරෙන අතර සීමාවන් පැනවීමේ පියවර පැනවීමට ප්‍රයත්න දරා ඇත.

ඒ සමග ම, රාවුල් කස්ත්‍රෝගේ ආන්ඩුව එක්සත් ජනපදය සමග නව රාජ්‍යතාන්ත්‍රික හා ආර්ථික සබඳතා ගොඩනැගීමට සිය එකඟත්වය පල කොට ඇත. මේ තත්වය ඇති වී තිබෙන්නේ 1959 වසරේ විප්ලවයෙන් අනතුරුව එක්සත් ජනපද ව්‍යාපාරයන්ගේ දේපල ජනසතු කිරීමට විරුද්ධව දශක පහකට ආසන්න කාලයක් තුල වොෂිංටනය විසින් පනවන ලද ආර්ථික වට ලෑමෙන් පසුව ය.

ඒ හා සමානව, කියුබාව පිලිබඳ සිය පිලිවෙතෙහි වෙනසක් ඇති කිරීමට කැමැත්තක් ඔබාමා පාලන තන්ත්‍රය පෙන්නුම් කොට ඇත. අරමුනු කිහිපයක් එකවර සපුරාලන ඩොලර් බිලියන 140ක් වැය කිරීමට නියමිත පනතකට එක්සත් ජනපද සෙනෙට් මන්ඩලය විසින් අනුමැතිය දෙන ලදුව ජනාධිපති ඔබාමාගේ අත්සන තබා ඇත. කියුබාවට එරෙහිව බුෂ් පාලන තන්ත්‍රය විසින් පනවන ලද එක්සත් ජනපදයේ දැඩි සම්බාධක ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් නොසැපයීමේ නියමයක් ද මේ පනතට ඇතුලු විය. මෙසේ ලිහිල් කරන ලද සම්බාධකවලට එක්සත් ජනපදයෙහි ජීවත්වන කියුබානුවන්ට තම රටට යෑම පිලිබඳව ද කියුබාවේ වෙසෙන සිය ඥාතීන්ට යැවෙන මුදල් සම්බන්ධයෙන් පනවා තිබූ දැඩි සීමා ද ඇතුලත් ය.

මේ අර්ධ පියවර බලපෑම් යෙදීමේ කියුබානු විරෝධී කන්ඩායමේ කෝපයටහේතු විය. අන්තවාදී කස්ත්‍රෝ විරෝධියෙකු වන නිව් ජර්සියේ ඩිමොක්‍රැටික් පක්ෂ සෙනෙට් සභිකරොබට් මෙන්ඩේස්ගේ විරෝධය හමුවේ මෙම අරමුදල් සැපයීමේ මුලු පනත ම කෙටි කාලයකට පමාවීමට ආසන්න තත්වයකට පත් වුනි. මෙයට ප්‍රතිචාර වශයෙන් වෙලඳම පිලිබඳ ප්‍රධාන ආර්ථක සම්බාධක තව දුරටත් පවත්වා ගෙන යන බවට රටින් බැහැරව සිටින දක්ෂිනාංශික කියුබානු විරෝධී බලපෑම් යෙදීමේ කන්ඩායමට සහතික වීමට ඔබාමා පාලන තන්ත්‍රය යුහුසුලු විය. කියුබාව තුල අතිවිශාල ලාභ ගැරීමේ අපේක්ෂාවෙන් පසුවන එක්සත් ජනපද වානිජ මන්ඩලය හා කර්මාන්ත කරුවන්ගේ ජාතික සංගමය විසින් මේ ප්‍රතිඵලය සම්බන්ධයෙන් සිය කැමැත්ත පල කොට ඇත. එම සීමාවන් පවා ලිහිල් කිරීමේ හැකියාව පවතින නමුදු කස්ත්‍රෝ තන්ත්‍රය ඉදිරියෙහි මේ මගින් බරපතල උභතෝකෝටිකයක් පැන නංවයි.

දශක ගනනාවක් තුල කස්ත්‍රෝවාදය, කියුබාව තුල සිය දේශපාලනමය සුජාතභාවය පවත්වා ගෙන ඇත්තේ ආක්‍රමනයේ හා ආර්ථික පීඩනය යෙදීමේ දී එක්සත් ජනපදය ගෙනගිය නිර්දය ව්‍යාපාර කෙරෙහි පැවති ජාතික වෛරය තුලිනි. වොෂින්ටනය සමග සබඳතා සාමාන්‍ය තත්වයකට ගෙන ඒම සඳහා ගන්නා ඕනෑම පියවරක්, හා ඒ සමග දිවයිනෙහි ආර්ථිකය විදේශ ධනේශ්වර ආයෝජනයට තව දුරටත් විවෘත කිරීම තුලින් බරපතල දේශපාලන හා සමාජීය ආතතීන් පැන නැගීම අනිවාර්ය වනු ඇත.

නෙරපා හරින ලද ප්‍රධාන නිලධාරීන් දෙදෙනා "බාහිර සතුරාගේ" අපේක්ෂාවන් පෝෂනය කල බවට ෆිදෙල් චෝදනා කල ද යථාර්ථය නම්, සිදු කරන ලද වෙනස් වීම එක්සත් ජනපද අධිරාජ්‍යවාදය දකින්නේ වඩාත් සමීප එක්සත් ජනපද-කියුබානු සබඳතාව පිලිබඳ සූදානමේ ඉඟියක් ලෙස ය යන්නයි.

පිටුවහලේ ඇති දක්ෂිනාංශික කියුබානු පුවත්පත් හැරුනු විට ජනමාධ්‍ය ව්‍යාපාර තුල කස්ත්‍රෝවාදී නෙරපාහැරීම් පිලිබඳව හෙලාදැකීමක් නැති තරම් ය. සත්තකින් ම, *ටයිම්ස් සඟරාව*, වෙනස්වීම පිලිබඳ ලිපියකින්, එයට අනුමැතිය පල කරයි. එම ලිපියෙන් කියුබාවේ හිටපු එක්සත් ජාතීන්ගේ තානාපති වූ කියුබාවේ නව විදේශ ඇමති බෲනෝ රොඩ්රිගුවෙස්, පෙරෙස් රොක් හා අතර සැසඳීමක් කරයි. වරෙක පෙරෙස් රොක් තමා විසින් ම හඳුන්වාගත්තේ කියුබානු "තලිබාන්" හි කොටසක් ලෙස ය.

වොෂින්ටනය හා හවානා අතර සුහද සබඳකම් යලි පිහිටුවා ගැනීමේ ශක්‍යතාව ගැන සඳහන් කරමින් *ටයිම්ස් සඟරාව* මෙසේ ලිවී යː "සත්තකින්ම එවැනි රාජ්‍යතාන්ත්‍රික අභියෝගයකට මුහුන දීමට සුදුසු පුද්ගලයා කියුබානු තලිබාන්වරයා නොවේ. එම නිසා, රාවුල් හපනෙකු වී නම්, ඔහු තම නව විදේශ ඇමති තෝරා ගන්නේ හුදෙක් ම නාමික නායකයෙකු වීමට නොවේ. - අනික් අතට, ඔබාමා ප්‍රඥාවන්ත නම්,

කියුබාවෙහි විදේශ අමාත්‍යාංශයේ නව පුද්ගලයා සමග ගනුදෙනු කිරීමේ වෑයමක ධවල මන්දිරය නිරත වනු ඇත."

මේ අතර වාරයේ, මුඛ්‍ය ආර්ථික හා කාර්මික අමාත්‍යංශ භාරව හමුදා නිලධාරින් පත් කිරීම වනාහි ගැඹුරුවන සීමා පැනවීම, තීව්‍රවන සූරාකෑම හා සිය අවශ්‍යතාවන් විදේශීය ප්‍රාග්ධනයට තව දුරටත් යටත් කිරීම සම්බන්ධයෙන් කියුබානු කම්කරුවන් තුලින් අනිවාර්යයෙන්ම නැගී ඒමට නියමිත ප්‍රතිරෝධයට එරෙහිව කස්ත්‍රෝ තන්ත්‍රය මර්දනකාරී පියවර ගැනීමට සූදානම් වන බවට කෙරෙන අනතුරු ඇඟවීමකි.

කතුවරයා විසින් කියවීමට නිර්දේශිත ලිපිඃ *ලෝක අර්බුදයෙහි සෙවනැල්ල යටතේ කියුබාව විප්ලවයෙහි 50 වැනි සංවත්සරය සලකුනු කරයි 2009 ජනවාරි 03 ලිපිය.*

© www.wsws.org